# සංස්කෘතික සංවර්ධනයට අධ්‍යාපනය බලපාන ආකාරය

**එච්. එම්. සමරකෝන් බණ්ඩා**

ඕනෑම රටක සංස්කෘතිය (culture) සහ අධ්‍යාපනය (Education) අතර ඇත්තේ ඉතා සමීප අවියෝජනීය සම්බන්ධතාවයකි. එනම් සංස්කෘතියෙන් තොර අධ්‍යාපනය ගැන ද, අධ්‍යාපනයෙන් තොර සංස්කෘතිය පිළිබඳ ව ද කථා කිරීම දුෂ්කරය. එය එකම කාසියේ දෙපැත්තක් බඳු ය. එනම් අධ්‍යාපනයෙන් සංස්කෘතිය පෝෂණය වන අතර සංස්කෘතියෙන් අධ්‍යාපනය පෝෂණය වේ. එම නිසා සංස්කෘතික සංවර්ධනයේ පදනම අධ්‍යාපනය ලෙස සැලකීම වඩාත් සාධාරණ වේ යැයි පෙන්වා දිය හැකි ය. තවද යම් රටක සංස්කෘතිය ආධ්‍යාත්මික හා භෞතික යන අංශ දෙකින් ම පරිණාමනය වන්නේ අධ්‍යාපනය හේතු කොට ගෙන ය. එමෙන් යම් රටක අධ්‍යාපනය උසස් මට්ටමින් සංවර්ධනය වේ ද එහි සංස්කෘතියත් උසස් මට්ටමින් සංවර්ධනය වේ. එමෙන්ම උසස් සංස්කෘතියක් පවතින සමාජයක අධ්‍යාපනය ද උසස් ලෙස සංවර්ධනය වේ. එම නිසා අධ්‍යාපනය සංස්කෘතිය මූර්තිමත් කරන ප්‍රබල උපකරණයක් ලෙස ද සංස්කෘතිය පවත්වා ගෙන යන බලවේගයක් ලෙස ද සමීප සබඳතාවකින් ක්‍රියාත්මක වන බව මේ පිළිබඳ අදහස් දක්වන බැන්ටොක් (Bantock, 1968) පෙන්වා දෙයි. මේ අනුව අධ්‍යාපනය යම් ජන සමාජයක සංස්කෘතික සංවර්ධනයට දායක වන්නේ කෙසේ දැයි විවිධ දෘෂ්ටිකෝණවලින් විමසා බැලීම මෙම ලිපියේ ප්‍රධාන පරමාර්ථය යි.

අධ්‍යාපනය ජන සමාජයක සංස්කෘතික සංවර්ධනයට දායක වන්නේ කෙසේදැයි සොයා බැලීමේ දී සංස්කෘතිය යන සංකල්පය පිළිබඳ ව පළමුව විමසා බැලීම වැදගත් වේ. මේ පිළිබඳ ව අදහස් දක්වන ක්‍රෝබර් (Krober, 1963) පෙන්වා දෙන්නේ ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සංස්කෘතිය යනු සංකල්පය පිළිබඳව ඉදිරිපත් වී ඇති නිර්වචන සංඛ්‍යාව එකසිය හැටහතරකට (164) වඩා වැඩි බව ය. 'සංස්කෘතිය' යනුවෙන් සිංහලෙන් ව්‍යවහාර කරන වචනය

'සං' යන උපසර්ගයෙන් හා 'කෘ' යන ධාතුවෙන් සැදුණු සංස්කෘත භාෂාවේ වචනයකි. ඉංග්‍රීසි භාෂාවේ culture යන වචනයේ අර්ථය දීමට 'සංස්කෘතිය' යන පදය සිංහලෙන් භාවිත කරනු ලැබේ. එහි අර්ථය සකස් කර ගත් යන්න යි. ඒ අනුව සිංහල ජාතිය විසින් සකස් කරගත් සංස්කෘතිය සිංහල සංස්කෘතිය යි. යුරෝපීය ජාතීන් විසින් සකස් කරගත් සංස්කෘතිය යුරෝපීය සංස්කෘතිය යි. මෙලෙස බෞද්ධ සංස්කෘතිය, මුස්ලිම් සංස්කෘතිය, ඉංග්‍රීසි සංස්කෘතිය, විශ්ව විද්‍යාල සංස්කෘතිය ආදී වශයෙන් ප්‍රධාන සංස්කෘතීන් හා උපසංස්කෘතීන් නිර්මාණය වී ඇත. මේ පිළිබඳ ව අදහස් දක්වන චප්මාන් (Chapman, K:1986) පෙන්වා දෙන්නේ ඒ ඒ සංස්කෘතීන්ගේ විවිධත්වය, ඔවුන් සතු දැනුම කුසලතා හා ආකල්පවල ස්වභාවය හෙවත් අධ්‍යාපනය මත ගොඩනැඟී ඇති බව ය.

මානව සංස්කෘතිය පිළිබඳ ව මෙතෙක් ඉදිරිපත් කර ඇති නිර්වචන අතුරින් වඩාත් විද්‍යාත්මකවූත්, විග්‍රහාත්මකවූත් එමෙන්ම යථාර්ථවාදීවූත්, විශ්ව සාධාරණවූත්, සමාජ හා මානව විද්‍යාත්මක නිර්වචනයක් ඉදිරිපත් කර ඇත්තේ ටයිලර් (Tylor, 1871:1) විසින් බව පිළිගත් මතයකි. ඔහු පෙන්වා දෙන පරිදි සංස්කෘතිය යනු "ඕනෑම පුද්ගලයෙක් තමා ජීවත්වන පරිසරය තුළින් හුරු පුරුද්දෙන් සහ තම හැකියාවන් මඟින් ලබන දැනුම, ඇදහිලි, කලාව, සදාචාරය, නීති රීති, සිරිත් විරිත්, යන මේ සංකීර්ණ සමස්තය යි."

(Culture or civilization, taken in tis wide ethnographic senses that are complex whole which includes, knowledge, law, custom and any other capabilities and habits acquired by man as & member of society)

මෙම නිර්වචනය ඉතා පුළුල් ලෙස විග්‍රහ කරන විට පෙනී යන්නේ සංස්කෘතිය යන්න මානව සමාජයේ සෑම ක්ෂේත්‍රයක් පුරාම විහිද යන සංකල්පයක් බවයි. එහිදී පුද්ගලයෙකුගේ දැනුම විශ්වාස, ආගමික ඇදහිලි, සිතුම් පැතුම් ආදියෙන් යුත් අභෞතික සංස්කෘතිය ද (Non Material Culture) පුද්ගල හැකියාවන් මත ගොඩනැගෙන භෞතික සංස්කෘතිය ද (Physcical Culture) යන අංශ, දෙක ම අවධාරණය වී තිබේ. ටයිලර් ඉදිරිපත් කළ මෙම නිර්වචනය කිහිප

ආකාරයකින් ම වැදගත් වන බව පෙනී යයි. ඒ අතර එය සෑම අවස්ථාවකට ම සම්බන්ධ වන්නේ පුද්ගල කණ්ඩායමක් හෙවත් සමාජයක් සමග වීම විශේෂත්වයයි. එමෙන්ම ඕනෑම පුද්ගලයෙකුට සංස්කෘතිය යන්න ලබා ගත හැක්කේ හුරුපුරුද්දෙන් වීම මීළඟ වැදගත්කමයි. මේ අනුව කිසියම් මිනිසකු තමා ජීවත්වන පරිසරයට ආවේණික වූ ප්‍රතිමාන (norms) සදාචාරය, සිරිත් විරිත්, භාෂාව යනාදී හුරුවීමට නම් අනිවාර්යයෙන් ම එහි සාමාජිකයෙකු විය යුතු ය. එය සම්පූර්ණයෙන් ම සමාජානුයෝජන ක්‍රියාවලියක් (Socialization Process) බව බැලන්ටයින් (Ballentine, J.lt, 1977) පෙන්වා දෙයි. ටයිලර් පෙන්වා දෙන තවත් වැදගත් කරුණක් වන්නේ සංස්කෘතිය යනු අඛණ්ඩ ඓතිහාසික ක්‍රියාවලියක් (Continuous Historical Process) බවයි. මෙහිදී සංස්කෘතිය වර්ධනය කර ගැනීම, අර්ථවත් කර ගැනීම, සඳහා තම හැකියාවන් හා පුරුදු ඔප මට්ටම් කර ගැනීම අධ්‍යාපනයේ බලපෑමෙන් සිදුවන බව පෙන්වා දිය හැකි ය. එනම් සංස්කෘතිය පුද්ගලයෙකුට ජන්මයෙන් හෝ ජීව විද්‍යාත්මකව උරුම වන්නක් නොව සමාජ ක්‍රියාවලිය ප්‍රතිඵලයක් බව පැහැදිලිය. එවිට එම සමාජයේ කටයුතු තීරණය වන්නේ, වර්ධනය වන්නේ සහ සමාජ ප්‍රතිමානවලට එක්වන්නේ ඔවුන් ලබන අධ්‍යාපනයේ ස්වභාවය මතය. ඒ අනුව ද සංස්කෘතික සංවර්ධනයේ පදනම අධ්‍යාපනය බව තහවුරු වේ.

ඕනෑම සමාජයක පළමුව ඇතිවන්නේ සංස්කෘතිය ද සමාජය ද යන්න ගැටලුවකි. මේ පිළිබඳ අදහස් දක්වන මෙරිල් (Merrill, 1957) පෙන්වා දෙන්නේ පළමුව සමාජය ද දෙවනුව සංස්කෘතිය ද නිර්මාණය වන බවයි. මේ පිළිබඳ අදහස් දක්වන බිඩ්නි (Bidney, 1953) ගේ අදහස් අනුව කිසියම් සමාජයක පුද්ගලයන් අතර සිදුවන අන්තර් ක්‍රියාකාරිත්වය පදනම් කර ගෙන සංස්කෘතියක් සකස් වන බව පෙන්වා දෙයි. මීට සමාන අදහස් ඉදිරිපත් කරනු පිලිප් (Philip, 1953) පාසන්ස් (Parsons, 1951) කාල්ටන් (Carlton, 1954) සහ මීඩ් (Mead, 1938) ආදීහු පෙන්වා දෙන්නේ මිනිසා එකිනෙකා සමග ඇති කරගනු ලබන සාමාජික සම්බන්ධතා පදනම් කර ගෙන, පරපුරෙන් පරපුරට, යුගයෙන් යුගයට උරුම කරගනු ලබන්නා වූ දැනීම (knowledge), අත්දැකීම (experience) සම්මිශ්‍රණය වූ හැසිරීම් රටාව සංස්කෘතිය ලෙස අර්ථ දැක්විය හැකි බව ය. මේ අනුව අධ්‍යාපනයෙන්

සිදු කරන්නේ ද මිනිසාගේ චර්යා රටාව සංවර්ධනය කරමින් තම දැනුම, කුසලතා හා ආකල්ප සමුදායක් සංස්කෘතියට එකතු කිරීම ය. එම නිසා අධ්‍යාපනය නැති තැන, සංස්කෘතිය එක තැන පල්වෙන තත්වයකට පත්වනු නිසැක ය.

සංස්කෘතිය යන සංකල්පයේ විවිධ ලක්ෂණ විමසා බැලීමේ දී ද පැහැදිලි වන්නේ එහි පදනම අධ්‍යාපනය බව ය. මේ අනුව මානව විද්‍යාඥයින්ගේ පිළිගැනීම් ඇසුරෙන් සකසා ඇති සංස්කෘතියක ලක්ෂණ කිහිපයක් රොසන්බර්ග් (Rosenberg, 1979) මෙසේ පෙන්වා ඇති බව අමරසේකර, (1991) සඳහන් කරයි.

I. සංස්කෘතිය ඉගෙනගත් දෙයකි.

II. සංස්කෘතියෙහි ප්‍රභවය, පටන් ගැන්ම මානව පැවැත්මේ ජීව විද්‍යාත්මක, පාරිසරික දේහ විද්‍යාත්මක හා ඓතිහාසිකමය දේ සමගින් ය.

III. සංස්කෘතිය ව්‍යූහගත ය.

IV. සංස්කෘතිය බෙදාහදා ගැනීමේ ක්‍රියාවලියකි.

V. සංස්කෘතිය කාලය අනුව සමාජය අනුව වෙනස් වේ.

VI. සංස්කෘතිය ස්ථාවර නොවේ.

VII. සංස්කෘතිය පුද්ගලයාගේ පෞද්ගලික සහ සමාජීය ක්‍රියාකාරකම් නිරවුල් කරයි.

VIII. සංස්කෘතිය විද්‍යාත්මක ක්‍රමවේදයන්ගෙන් විශ්ලේෂණය කිරීමේ හැකියාව විදහාපායි.

සංස්කෘතියක ස්වභාවය පිළිබඳ මෙම ලක්ෂණ විමසා බැලීමේ දී පැහැදිලි වන්නේ, සංස්කෘතිය ස්ථාවර ඒක ඝන වූ වස්තුවක් නොවන බව ය. ඒ අනුව යම්කිසි සමාජයක අගයක් (values) විශ්වාස පද්ධතිය (a set of beliefs), ප්‍රතිමාන (norms), තාක්ෂණය (technology), භාෂාව (language) යනාදී සියලු ම සංස්කෘතිකාංග මිනිසා උසස්

ලෙස සිතන්නට පටන් ගැනීම, හුරුපුරුදු වීම හා ඒවා සංවර්ධනය කර ගැනීම අධ්‍යාපන විසින් අනුබල ලත් දෙයකි. මෙලෙස උසස් ලෙස සිතන සියල්ල ම සංස්කෘතිය ලෙස සැලකිය හැකි බව මේ පිළිබඳ ව අදහස් දක්වන මැතිව් ආර්නොල්ඩ්ගේ අදහස් විග්‍රහ කරමින් හෙන්රි වීරසිංහ, (1977) පෙන්වා දෙයි. ආර්නෝල්ඩ්ගේ අදහස් විමසා බලන විට මිනිසාගේ සංස්කෘතියේ සෑම අංගයක් ම සමග ම බැඳී පවතින චර්යාව උසස් තත්වයට පත් කරන්නේ අධ්‍යාපනයේ බලපෑම හේතු කොට ගෙන බව පැහැදිලි ය. විශේෂයෙන්ම මිනිසුන් එකතුවන අන්දම ඔවුන් විරුද්ධවන අන්දම සමාජ ජීවිතයේ චාරිත්‍ර වාරිත්‍ර උත්සව මෙන්ම තහංචි පමණක් නොව, සිතුම් පැතුම් අදහස් උදහස් ඇදහිලි, විශ්වාස, නිර්මාණාත්මක කුසලතා, භාෂාව, සාහිත්‍ය, කලාව, ඔපමට්ටම් කරන්නේ අධ්‍යාපනය විසිනි. න්‍යායාත්මක ලෙස බැලුවත්, ප්‍රායෝගික ලෙස බැලුවත් සංස්කෘතිය වඩා වඩාත් සංවර්ධනය කරන්නේ අධ්‍යාපනය මඟින් ය. ඒ අනුව අධ්‍යාපනය ජන සමාජයක සංස්කෘතිය නිරූපණය කරන සමස්ත දැනුම් සම්භාරය, කුසලතා සමූහය හා ආකල්ප සමුදාය අර්ථවත් පරිදි හැඩගැස්වීමේ කාර්යයේ නිරත වී සිටියි.

අධ්‍යාපනය සංස්කෘතික දායාදයන් බාල පරම්පරාවට පවරාදීමේ (Transmission of cultural heritage) ක්‍රියාවලියෙහි නිරතව සිටී. එහිදී සංස්කෘතික වශයෙන් සමාජය මඟින් පිළිගෙන ඇති අගයන් ප්‍රතිමානයන් හා සම්ප්‍රදායානුගත සම්මතයන් පිළිබඳ ව මනා අවබෝධයක් ලබාදීමත්, ඒ අනුව දිවි පෙවෙත හැඩගැස්වීමත් අධ්‍යාපනය මඟින් සිදු කෙරේ. මෙහි දී සිකරින් පෙන්වා (අධ්‍යාපනයේ සමාජ විද්‍යාත්මක පදනම, 1989) අධ්‍යාපනය මඟින් රටක සියලු පුරවැසියන් සඳහා දැනුම් සම්භාරයත්, ආකල්ප සමුදායත් හා කුසලතා සමූහයත් ලබා දීම අධ්‍යාපනය විසින් කරනු ලබන බව ය. මේ දැනුම ලබා දෙන අධ්‍යාපනයේ කේන්ද්‍රස්ථානය හා මූලික සමාජානුයෝගීකාරකය ලෙස සැලකෙන පාසල විසින් කරනු ලබන්නේ සමාජයක සංස්කෘතිය බාල පරපුරට උරුම කරදීමේ වැදගත්ම කාර්යයයි. මෙහි දී පාසල එය පවත්නා සමාජයේ සිතුම් පැතුම් අදහස් උදහස් විශ්වාස ඇදහිලි, පමණක් නොව ඒවායේ අව්‍යාජත්වය, උදාරත්වය, ආදීනත්වය පිළිබඳ විචාර පූර්වක ඥානය ප්‍රගුණ කිරීමක් ද සිදු කෙරේ. ඒ අනුව පෙන්වා දිය හැක්කේ අධ්‍යාපන ක්‍රියාවලිය සිදු

කෙරෙන මොන්ටිසෝරිය, පාසල, විශ්වවිද්‍යාලය ස්වකීය සංස්කෘතිය පවත්වා ගෙන යාම පමණක් නොව සංස්කෘතිය, අලුත් කිරීම හැඩගැස්වීම සංවර්ධනය කිරීම සිදු කරන බවයි. මෙලෙස අධ්‍යාපනය මඟින් සංස්කෘතික සංවර්ධනයට ප්‍රබල දායකත්වයක් ඉටු කෙරේ.

සමාජ විද්‍යාවේ වස්තු විෂය සමාජය යි. එහෙත් අධ්‍යාපනය පුද්ගලයාගේ හා සමාජයේ සංස්කෘතික චර්යාව අර්ථවත් කිරීම කෙරෙහි විශාල බලපෑමක් ඇති කරයි. උපන් මොහොතේ සිට මරණාසන්නය දක්වා ම මෙම චර්යාව වෙනස් කිරීමේ කර්තව්‍යය සිදු කරන බව ස්ටෙන්හවුස් (Stenhouse, 1967) පෙන්වා දෙයි. අධ්‍යාපනය විසින් කරනු ලබන මෙම සංස්කෘතිකකරණ ක්‍රියාවලිය (enculturisation process) සම්පූර්ණ ජීවිත කාලය පුරාම සිදු වේ. මෙහිදී හරිදේ හා වැරදි දේ කුමක්දැයි ඉගෙනීම, කථා කරන හා ලේඛනය ආශ්‍රිත භාෂාව ඉගෙනීම ආගන්තුක සත්කාර සිරිත් විරිත්, ආහාර පරිභෝජන රටාව, සම්ප්‍රදායයන්, ක්‍රීඩා, විනෝද කටයුතු, අන්තර් සම්බන්ධතා දැක්වීම, අඳින පලඳින විධිය යන එක ආකාරය අවස්ථාවට උචිත පරිදි ක්‍රියා කිරීම යහපත අයහපත, යුතුකම් වගකීම්, චින්තනය, වේදනය, ආකල්ප අපේක්ෂණ සංස්කෘතියට අනුව හැඩගස්වා ගැනීමේ හැකියාව අධ්‍යාපනය විසින් ඇති කෙරේ. මෙහි දී සමාජ ක්‍රමය තුළ පවතින සංස්කෘතිය ළදරුවා වෙත පවරා දී, ඔහු සමාජයට උචිත පරිදි හැඩගස්වා නිර්මාණය කර, ළමයාගේ චින්තනය, වේදනය, චර්යාව ක්‍රමානුකූලව අඛණ්ඩ ව සමාජ සාරධර්මයන්ට අනුකූලව සකස් කිරීමේ අද්විතීය කාර්යය අධ්‍යාපනය විසින් සිදු කරයි. ඒ අනුව මිනිස් චර්යාව උත්තරීතර තත්වයට පත් කිරීම සංස්කෘතිය සංවර්ධනය කිරීමක් (Development of culture) සහ සංස්කෘතිය ආරක්ෂා කිරීමක් (presevation of culture) ලෙස පෙන්වා දිය හැකි ය.

ඕනෑම ජන සමාජයක භාෂාව හා සංස්කෘතිය අතර ඇත්තේ ප්‍රබල සමීප සබඳතාවය කි. භාෂාව සංස්කෘතියේ ම ප්‍රතිඵලයක් බවත් සංස්කෘතියේ වර්ධනයට හෝ පසුබැස්මට හේතු වන්නේ ද භාෂාව බවත් ධර්මදාස, (1972) පෙන්වා දෙයි. මෙම භාෂාව සංවර්ධනයට රටේ ප්‍රබල කාර්ය ඉටු කරන්නේ අධ්‍යාපනය යි. අධ්‍යාපනයේ මූලික ක්‍රියාකාරී පදනම මත භාෂාව සංස්කෘතියේ උරුමයක් ලෙස

සැලකිය හැකි බව සැසියර් (Sapir, 1949: 01) විසින් පෙන්වා දෙයි. ඔහුගේ අදහස් අනුව පුද්ගලයෙකුගේ ශාරීරික අංග ලක්ෂණ තම දෙමව්පියන්ගෙන් ලද දායාදයක් වුවත් භාෂාත්මක අවබෝධය තමා ජීවත් වන සමාජයෙන් හා පරිසරයෙන් ලැබෙන්නකි. මෙසේ පුද්ගලයා ඉගෙන ගන්නා සෑම වචනයකින් ම ඔහු එම සමාජයේ සංස්කෘතිය ද ඉගෙන ගනී. ඊට හේතුව සංස්කෘතිය වචන මඟින් ප්‍රකාශවන බැවිනි.

මේ අනුව පුද්ගලයෙක් සමාජයේ සෙසු පුද්ගලයන් සමග සම්බන්ධතා ඇති කර ගැනීමේ දී පුද්ගලාන්තර සන්නිවේදන රටාවක් ද, සමාජ ප්‍රභේදවලට ආවේණික වූ සංස්කෘතික රටාවක් ද ගොඩනැගේ. ඒ අනුව ද භාෂාවත් සංස්කෘතියත් අතර ඇත්තේ ප්‍රබල සම්බන්ධතාවයක් බව පෙනී යයි.

මේ පිළිබඳ අදහස් දක්වන බෝලින්ගර් (Bolinger, 1968: 03) පෙන්වා දෙන්නේ මනුෂ්‍ය භාෂාව මිනිසා ජීවත්වන සමාජයේ උරුමයක් (Social Heritage) බව ය. එනම් පුද්ගලයෙකුගේ භාෂා රටාව සංස්කෘතියේ ප්‍රතිඵලයක් බව ය. මෙලෙස භාෂාවක් භාවිත කිරීමේ හැකියාව බිළිඳුන් තුළ සහජයෙන් ම පිහිටා තිබෙන අතර භාෂාවක් පුරුදු පුහුණු වීම සංස්කෘතියේ ආභාෂයෙන් සිදුවන බව චොම්ස්කි (Chomsky, 1986) වැනි වාග් විද්‍යාඥයින්ගේ අදහස්වලින් ද පැහැදිලි වේ. මේ අනුව ද පැහැදිලි වන්නේ, භාෂාවත් සංස්කෘතියත් අතර ප්‍රබල සම්බන්ධතාවයක් පවතින බව ය.

කිසියම් භාෂාවක් හා එම භාෂාව නියෝජනය කරන සංස්කෘතිය අතර පවතින සම්බන්ධතාවයේ ස්වභාවය පෙන්නුම් කරන යුනෙස්කෝ (Unesco, 1953: 4) ප්‍රකාශනයක් පැහැදිලි කරන්නේ භාෂාවත් සංස්කෘතියත් අතර නොබිඳෙන සබඳතාවක් පවතින බව ය. එහිදී භාෂාව මඟින් සංස්කෘතිය උරා ගන්නා බව පහත අයුරින් පැහැදිලි කරයි. එනම්,

"සෑම ළමයෙකු ම කිසියම් සංස්කෘතියක පරිසරයක උපදියි. භාෂාව එම සංස්කෘතියෙහි කොටසක් මෙන්ම එම සංස්කෘතිය ප්‍රකාශ කිරීමේ මාධ්‍යයක් ද වෙයි. ළමයා තමා උපන් සංස්කෘතික පරිසරය උරා ගැනීමේ ක්‍රියාවලියේ විශාල කොටසක් උරා ගන්නේ මව් බස ඉගෙනීම තුළිනි."

මේ අනුව භාෂාව ඉගෙනීම සංස්කෘතිය උරා ගැනීමක්, ලෙස සැලකිය හැකි ය. පුද්ගලයෙකුට සංස්කෘතිය ඉගෙන ගැනීමටත් එය පවත්වා ගැනීමටත් ප්‍රකාශ කිරීමටත් භාෂාව අවශ්‍ය වේ. මේ අතර භාෂාව යනු, සංස්කෘතිය ගබඩා කර තිබෙන ස්ථානයක් (Language is the storehouse of culture) බව හැරිස් (Harris, 1989) පෙන්වා දී ඇත. එමෙන්ම භාෂාව යනු සංස්කෘතියේ ප්‍රධාන වාහකයා "Language is the chief vehicle of culture" ලෙස ද මානව විද්‍යාත්මක අදහස් ඉදිරිපත් කරමින් පෙරේරා, (2001) පෙන්වා දෙයි. මේ අනුව ද පෙනී යන්නේ භාෂාව මහා සංස්කෘතිය මෙන්ම, උප සංස්කෘතිය (Sup culture) විදහා දක්වන වැදගත් උපකරණයක් බව ය. එම නිසාම සංස්කෘතිය පවත්වා ගෙන යන, සංස්කෘතිය බෙදා හරින, නවීකරණය කරන හා ආරක්ෂා කරන ප්‍රධාන සංස්කෘතික උපකරණයක් ලෙස භාෂාව හඳුන්වා දිය හැකි ය. එනම් භාෂාව සංස්කෘතිය පවත්වා ගැනීම හා සංවර්ධනය කරන ක්‍රියාකාරී බලවේගයක් ලෙස හඳුන්වා දිය හැකි ය.

තවද භාෂාව රටක සංස්කෘතියේ ප්‍රධාන අංග හතරක් අධ්‍යාපන ක්‍රියාවලිය ඔස්සේ සංවර්ධනය කෙරේ. මෙම චතුර්විධ භාෂා කුසලතා ලෙස සැලකෙන ශ්‍රවණය (listning) කථනය (speaking) කියවීම (reading) සහ ලිවීම (writing) යන භාෂාත්මක හැකියාවන් හතරම අධ්‍යාපනය මත රඳා පවතී. මෙම ශක්තීන් මඟින් සමාජයක සංස්කෘතිය ඉගෙනීම නිර්මාණය කිරීම, විග්‍රහ කිරීම, පැවරීම, වෙනස් කිරීම, ගබඩා කිරීම, යනා දී විවිධ කාර්යයන් සිදු කරනු ලැබේ.

අධ්‍යාපනය සමාජයක සංස්කෘතික සංවර්ධනයට දායකවීම සලකා බලන විට අධ්‍යාපන ක්‍රියාවලියෙන් සිදු කෙරෙන පුද්ගල සමාජානුයෝජනය බෙහෙවින් වැදගත් වේ. යම් පුද්ගලයෙක් උපතින් මිනිසෙක් වුවත් මිනිස්කම ලබාගත හැක්කේ සමාජානුයෝජනයෙන් හෙවත් සංස්කෘතික කරණයෙන් බව ඔග්බර්ග් සහා නිම්කොෆ් (Ogburn & Nimkoff, 1940) පෙන්වා දෙයි. යම් සමාජයක මිනිසුන් රාශියක් රාශිගත වූ පමණින් උසස් සංස්කෘතියක් ගොඩනැගෙන්නේ නැත. එසේ නම් එහි දැකිය හැක්කේ පුද්ගල සමූහයකගේ එකතුවක් පමණි. මෙහි දී පුද්ගලයන් මිනිසුන් බවට පත් කර උසස් මානව සංස්කෘතියක් ගොඩනැගීමට නම් එම සමාජ කණ්ඩායම තුළින් යහපත් හැසිරීම් රටාවක් පිළිඹිඹු විය යුතු ය. පිළිගත් සංස්කෘතික ප්‍රතිමාන (Accepted

cultural norms) එකඟව ක්‍රියාකිරීමේ හැකියාව තිබිය යුතු ය. මෙම උසස් සංස්කෘතිය බිහිකිරීමේ පදනම වැටෙන්නේ අධ්‍යාපනය ඔස්සේ සිදු වන සමාජානුයෝජන ක්‍රියාවලියෙන් (Socialization process) බව පෙන්වා දිය හැකි ය.

පාසලෙන් කෙරෙන සමාජානුයෝජනය යනු තම සංස්කෘතිය බාල පරපුරට උරුම කරදීම යැයි පවසන ලේඛකයන් අතර චයිල්ඩ් (Child, 1943: 18-19) ගේ අදහස බෙහෙවින් වැදගත් වේ. ඔහු පෙන්වා දෙන ආකාරයට දරුවා ඔහු අයත් කණ්ඩායමේ සංස්කෘතික රටාව පවරා දීම සමාජානුයෝජනයයි. එහි දී තමන් අයත් සංස්කෘතියේ කළ යුතු යැයි පිළිගත් දේ සහ නොකළ යුතු යැයි පිළිගත් දේ වටහා දීම සිදු කෙරේ. එයින් සිදු වන්නේ පුද්ගලයා සමාජයට උචිත ලෙස හැඩගැස්සීමයි. මීට බෙහෙවින්ම සමාන අදහස් ඉදිරිපත් කරන හැවින්ග්හර්ස්ට් (Havinghurst, 1962: 108) පෙන්වා දෙන්නේ සමාජයේ පිළිගත් සාමාජිකයෙකු වීම සඳහා කළ යුතු දේත්, නොකළ යුතු දේත් ඉගෙනීම සමාජානුයෝජන ක්‍රියාවලියෙන් සිදුවන බව යි. මෙයින් ඔහු අදහස් කර ඇත්තේ පුද්ගලයෙක් යම් සමාජ කණ්ඩායමක ජීවත් වීමේ දී පිළිපැදිය යුතු චාරිත්‍ර වාරිත්‍ර මෙන්ම සමාජයේ අදහස් උදහස්, සිතුම් පැතුම්, විශ්වාස හා ඇදහිලි පමණක් නොව ඒවායේ අව්‍යාජත්වය, උදාරත්වය පිළිබඳ විචාර පූර්වකව ග්‍රාහණය ප්‍රගුණ කර ගැනීමට ද මෙහිදී අවශ්‍ය බවයි. එසේ නොමැති වුව හොත් ඔහු එම සමාජය තුළ නිසි ලෙස සමාජානුයෝජනය නොවූ පුද්ගලයෙකු ලෙස සැලකේ. එනම් උසස් සංස්කෘතියක් ඔහු තුළ ප්‍රගුණ වී නැති බව පිළිගත හැකි ය.

මෙහි දී අධ්‍යාපනය මඟින් සිදුවිය යුත්තේ දෙමාපියන්ගේ කාබන් පිටපත් නිපද වීම නොව ඔවුන් වෙනස්වන සංස්කෘතියට උචිත ලෙස හැඩගැස්වීම බව මේ පිළිබඳ අදහස් දක්වන චිනෝයි (Chinoy, 1961) වැඩි දුරටත් පෙන්වා දෙයි. එනම් සමාජ වෙනස් වීමක් යනුවෙන් අදහස් කරන්නේ එම සමාජයේ සාමාජිකත්වය ලබන පුද්ගලයන්ගේ අගයන්, සාරධර්ම සිරිත් විරිත්, ආකල්ප, භාෂාව ඇඳුම් පැලඳුම් වැනි කුමන හෝ අංශයක නැතහොත් එම සියල්ලෙහි ම ඇති වූ වෙනසකි. එම නිසා පාසලක් හෝ පවුලක් සීඝ්‍රයෙන් දියුණු වන සමාජයක ගැටලු නිරාකරණය කර ගැනීමට තරම් සමත්කම් ලද

මනා චරිතයක් හා විචක්ෂණ බුද්ධියක් ඇති දරුවන් බිහි කළ යුතු ය. අධ්‍යාපනයෙන් අපේක්ෂිත ප්‍රමුඛතම කාර්ය ලෙස සැලකෙන මෙයින් සංස්කෘතික සංවර්ධනයට ලැබෙන්නේ ප්‍රබල දායකත්වයකි.

අධ්‍යාපනය සංස්කෘතික සංවර්ධනය කෙරෙහි බලපෑම විග්‍රහ කිරීමේ දී පාසලින් සිසුන් සකස් කළ යුත්තේ කෙසේ ද යන්න පිළිබඳ බැන්ක්ස් (Banks, 1968: 20) ඉදිරිපත් කරන අදහස් විමසා බැලීම වැදගත් වේ. ඔහු පෙන්වා දෙන්නේ අධ්‍යාපන ක්‍රියාවලියෙන් කෙරෙන සමාජානුයෝජන කාර්යය ගුණාත්මක සංස්කෘතියක් බිහි කිරීමට වගකීමෙන් ක්‍රියා කළ යුතු බව ය. මෙහි දී සාම්ප්‍රදායික ආකල්ප වෙනස් කොට, නවීකරණය සඳහා මාවත් සකස් කිරීමත් වෙනස්වීමට ඇති අකමැත්ත නැති කිරීමත්, අධ්‍යාපනය මඟින් සිදුවිය යුතු බව ද සමාජ ගමන ඇති කිරීමත්, උගතුන් අභිබවා අලුත් උගතුන් බිහි කිරීමත් අධ්‍යාපනය මඟින් උනන්දු කළ යුතු බව ද ඔහු වැඩි දුරටත් ප්‍රකාශ කරයි. මෙලෙස අධ්‍යාපනය ක්‍රියාත්මක වන, ස්වකීය සංස්කෘතිය පවත්වා ගෙන යන පාසල සමාජයේ ම ආකෘතියක් ලෙස සංස්කෘතිය සංවර්ධනය කිරීමට ප්‍රබල දායකත්වයක් දරයි. මේ අතර අධ්‍යාපනයෙන් සිදු කරන සමාජානුයෝජනයේ සංස්කෘතික කාර්යභාරය පිළිබඳ අදහස් දක්වන රෝංග් (Wrong, 1961: 184) පෙන්වා දෙන්නේ සමාජානුයෝජනයෙන් සිදුවන්නේ සංස්කෘතිය ව්‍යාප්ත කිරීම බව යි. එනම්,

"සමාජානුයෝජනය යන්නෙන් අදහස් කරන්නේ සංස්කෘතිය ව්‍යාප්ත කිරීමයි. සමාජයේ කොටසක් වන සංස්කෘතියට මිනිසා උපතින් ම ඇතුලු වේ. අනෙක් අතට මිනිසා අනෙකුත් අය සමග අන්තර්ක්‍රියා කිරීමට හුරු වේ. සෑම පුද්ගයෙක් ම සමාජයට හුරුවන්නේ බේරීමත් සමග ය. එහෙත් මෙයින් සෑම මිනිසෙක් ම වඩාත් උසස් සංස්කෘතියක් බිහි කරීම සඳහා අදාළ අගයන් හා පරමාර්ථයන් නිසි පරිදි ග්‍රහණය කර ගැනීමක් අදහස් නොකරයි."

මෙයින් පැහැදලි වන්නේ වඩාත් හොඳ සංස්කෘතියක් නිර්මාණය වීමට නම් අධ්‍යාපනයේ දායකත්වය ඉතා හොඳින් සිදු විය යුතු බව ය. කිසියම් පුද්ගලයෙක් උපතින් ම සංස්කෘතියට ඇතුලු වීම ප්‍රමාණවත් නොවන බව ද මෙයින් පැහැදිලි වන අතර කවර හෝ

අධ්‍යාපන ප්‍රවේශයක් ඔස්සේ අවශ්‍ය දැනුම, කුසලතා හා ආකල්ප සංවර්ධනය කර ගැනීම අවශ්‍ය වේ. කෙනෙකුට විධිමත් අධ්‍යාපනය, (Formal education), අවිධිමත් අධ්‍යාපනය (Non Informal), සහ නොවිධිමත් (Non Formal) අධ්‍යාපනයෙන් මෙම සංස්කෘතිකකරණය සිදු කර ගත හැකි ය. මෙම සමාජානුයෝජනය මූලික වශයෙන් ප්‍රාථමික සමාජානුයෝගීකාරකයක් වන පවුලෙන් ද ද්විතීයික වශයෙන් පාසලෙන් ද ලැබිය හැකි බවත් එසේ ලබන දැනුම කුසලතා ආකල්ප උසස් සංස්කෘතියකට දායක වන බවත් මේ පිළිබඳ අදහස් දක්වන බර්ගර් සහ ලුක්මන් (Burger & Lukman, 1966) පෙන්වා දෙයි.

අධ්‍යාපනය ඔස්සේ විෂයමාලාව මඟින් බාල පරම්පරාවට සමාජභූමිකා (Social Roles) පවරා දීම ද සංස්කෘතියට සංවර්ධනය අධ්‍යාපනය ප්‍රබල ලෙස දායක වීමේ වැදගත් ක්‍රියා මාර්ගයකි. පාසලේ පවතින කලා විෂය ධාරාව, වාණිජ විෂය ධාරාව ඔස්සේ ස්ත්‍රී පුරුෂ වශයෙන් ද බාලක බාලිකා හා මිශ්‍ර පාලස් සංස්කෘතීන්ගෙන් ද මෙම සමාජ භූමිකා පැවරීමේ කාර්යය සිදු කෙරේ. ස්ත්‍රී පුරුෂ වශයෙන් වෙන්ව ද එක්ව ද කටයුතු සංවිධානය කරනු ලැබේ. විවිධ විෂය සමගාමී කටයුතු ඔස්සේ ද සිසුන්ට භූමිකා කාර්යයන් ඉටු කිරීමට ලැබේ. මේ යටතේ විශේෂයෙන් ම කළමනාකරණ භූමිකාව, නායකත්ව භූමිකාව, සංවිධාන භූමිකාව, සැලසුම් කිරීමේ භූමිකාව තීරණ ගැනීමේ භූමිකාව, අණදීමේ භූමිකාව, උපදේශන භූමිකාව, සමාජ සේවා කටයුතු ගුරු භූමිකාව, සන්නිවේදන භූමිකාව, ක්‍රීඩාව, විනෝදවීම, සෞන්දර්යය නාට්‍ය ප්‍රදර්ශන, නිර්මාණ, ව්‍යාපාර කටයුතු කෘෂිකර්මය, ආගමික කටයුතු, සුරා කටයුතු චරිත නිරූපන සහාය සේවා ලබාදීම, වගකීම් යුතුකම් ඉටුකිරීම, නායකත්වයට සවන්දීම, උපදෙස් පිළිපැදීම විනය කටයුතු, සෞඛ්‍ය පිළිවෙත් සම්ප්‍රදායයින්ට, ගරු කිරීම, එකඟවීම, විරුද්ධවීම, ප්‍රශ්න ඇසීම, පිළිතුරු දීම, සාකච්ඡා කිරීම, බෙදාහදා ගැනීමේ පුරුදු, ආහාර පරිභෝජනය, පිළිවෙල පිරිසිදුකම, ක්‍රමවත් බව, ආදරය, විවාහය හා සිරිත් විරිත් සමාජ ප්‍රතිචාර සමාජ තහංචි, නීති රීති, (Discipline and rules) සම්මුතීන්, සංස්කෘතික උත්සව ආශ්‍රිත අවබෝධය, කළ යුතු දේ නොකළ යුතු දේ ලිංගික අධ්‍යාපනය කථා කරන ආකාරය, භාෂාව හසුරුවන විලාශය ලිවීම, කියවීම, ගැටලු නිරාකරණය, තර්කානුකූලව කටයුතු කිරීම හා සිතීම ආදී වශයෙන් තමාගේ අනාගත ජීවිතට ය අත්‍යවශ්‍ය සංස්කෘතික වශයෙන්

අගනා දැනුමත් කුසලතාවක් හා ආකල්ප සමුදායක් අධ්‍යාපනය ඔස්සේ සංවර්ධනය කෙරේ. මෙවැනි සංස්කෘතික වටිනාකමක් ඇති අධ්‍යාපනයක් ඔස්සේ සමාජගත වන පුද්ගලයින්ගේ සංස්කෘතිය ද උසස් තත්වයට පත් වේ.

අධ්‍යාපනය ඔස්සේ සමාජයේ ඇති කෙරෙන චිත්තවේග සංවර්ධනය ද සංස්කෘතිය ගුණාත්මක ලෙස සංවර්ධනය වීමට බෙහෙවින් ම හේතු සාධක වේ. මේ පිළිබඳ ව අදහස් දක්වන රොජර්ස් (Rogers, 1983) පෙන්වා දෙන්නේ සිසුන්ගේ චිත්තවේග සංවර්ධනය පිළිබඳ පාසලට පැවරෙන්නේ විශේෂ වගකීමක් බවයි. මේ අතර පීටර්ස්, (Peters) සිම්සන් සහ මෙයිනර් (Simpson and Weiner, 1989) පෙන්වා දෙන්නේ ළමුන්ගේ චිත්තවේග වැඩි දියුණු කිරීම ඔවුන්ගේ අනාගත සමාජ හා සංස්කෘතික ජීවිතය සාර්ථක කර ගැනීමට හේතු සාධක වන බවයි. යම් සමාජ කණ්ඩායමක චිත්තවේග ඔවුන්ගේ ජීවිත සංවර්ධනයට හෝ අසංවර්ධනයට ප්‍රබල ලෙස බලපෑම ධනාත්මක මෙන්ම ඍණාත්මකව සිදු වේ. විවිධ හේතු සාධක පදනම් කර ගෙන පුද්ගලයෙක් තුළ හටගන්නා චිත්තවේග විවිධාකාර වේ. පුද්ගලයා තුළ ධනාත්මක චිත්තවේග (Positive emotions) ඇති වූ විට යහපත් චර්යා රටාවක් පෙන්නුම් කරයි. එමෙන්ම ඍණාත්මක චිත්තවේග (Negative emotions) හටගත් විට අයහපත් චර්යාවක් පිළිබිඹු කරයි. සමාජයක සංස්කෘතිය පහළ මට්ටමකට පත් වීමට මෙම ප්‍රතිශේධාත්මක චිත්තවේග බලපාන අතර සංස්කෘතිය උසස් තත්වයකට පත්වීමට මෙම ධනාත්මක චිත්තවේග බලපායි. අධ්‍යාපනයෙන් සිදු කරන්නේ හැකිතාක් දුරට පුද්ගලයාගේ ධන චිත්තවේග වර්ධනය කරමින් ඔහු තුළ ඇති වන ඍණ චිත්තවේග අඩු කිරීමයි. මෙම කර්තව්‍ය සිදු කිරීමේ දී ගුරුවරයාට අධ්‍යාපන ක්‍රියාවලියට පැවරෙන කාර්යභාරය ද පුළුල් ය. ඉහත සඳහන් චිත්තවේග සංවර්ධනය කාර්ය කොතරම් සැලකිල්ලෙන් කළ යුතු ද එය සංස්කෘතික වශයෙන් කොතරම් වැදගත් වේ දැයි කොතලාවල, (1996) මෙසේ පෙන්වා දෙයි.

"චිත්තවේගී ගැටලු සහිත ළමයින් කල් තියා හඳුනා ගැනීමට සෑම ගුරුවරයෙක්ම සමත්විය යුතු ය. සාමාන්‍ය චර්යා සහ අනාකෘතික චර්යා අතර වෙනස ඔහු දැන සිටිය යුතු ය. ඒ තත්ත්ව දෙක අතර වෙසන එතරම් විශාල නොවේ. ළමයින් වැඩි දෙනා ඉදහිට බියක්

දක්වති. ආක්‍රමණශීලී වෙති. කංසාවෙන් පෙළෙති. මේ එක් එක් චර්යා සාමාන්‍ය ද අසාමාන්‍ය ද යන්න තීරණය කිරීම ළමයාගේ වයස හා අවස්ථාව බලා කළ යුතු වේ. එය ස්ථිර වශයෙන් තීරණය කළ හැකි කාලසීමාවක් නොවිය හැකි ය. විශේෂ උදව් සැපයීමට පෙර කොතෙක් කලක් එම අවිනිශ්චිත තත්වය පැවතිය යුතු ද යන්න මෙහි දී මතුවන ගැටලුව වේ. නිවැරදි තීරණයක් ගැනීම සඳහා නිරන්තරයෙන් ළමයින්ගේ හැසිරීම ඉගෙනීම කෙරෙහි දක්වන පෙළඹීම සහ සාධන මට්ටම ගැන විමසිලිමත් විය යුතු ය."

මෙම ප්‍රකාශනයෙන් පැහැදිලි වන්නේ චිත්තවේග සංකූලතා හා ගැනීම සමාජ සංස්කෘතික සංවර්ධනයට අහිතකර බැවින් ඒවා ඉතා ප්‍රවේශමෙන් හිතකර දිශාවට සංවර්ධනය කළ යුතු බව ය. මේ පිළිබඳ අදහස් දක්වන යුනෙස්කෝ (Unesco, 1972) වාර්තාවක් පෙන්වා දෙන්නේ අධ්‍යාපනය ඔස්සේ ළමා පරපුර චිත්තවේගීය වශයෙන් සංවර්ධනය වූ පිරිසක් බවට පත් කිරීම, රටක් අනාගත මානව සම්පත උසස් දැනුම කුසලතා ආකල්පවලින් පරිපූර්ණ වූ තත්වයකට පත් වීමට හේතු සාධක වන බව ය. එමෙන්ම පුද්ගලයාගේ ආධ්‍යාත්මික සංවර්ධනයටත් සමාජීය හා භෞතික සංවර්ධනයටත් තුඩු දෙන පෞරුෂ වර්ධනයට මානව දයාව, ජාත්‍යන්තර සහජීවනය හා සම්බන්ධතාව මෙන්ම සාමකාමී සමාජයක් ගොඩනැගීමට උසස් චිත්තවේග සංවර්ධනයක් තිබිය යුතු වේ. මේ අනුව ද පැහැදිලි වන්නේ වඩාත් උසස් සංස්කෘතියක් ගොඩනගා ගැනීමට ආදරය, දයාව, කරුණාව, සතුට, ධෛර්යය, සෙනෙහස සංවේදීතාවය, විනය ගරුක බව, ශාන්ත බව, පරෝපකාරය, නිර්මාණශීලීත්වය, ක්‍රියාශීලී බව වැඩ කරන ධනාත්මක ප්‍රතික්‍රියා සහිත චිත්තවේග සංවර්ධනය කිරීම අධ්‍යාපනය මඟින් සිදු කළ යුතු බව ය. එසේ නොවුන හොත් මිනිසුන් ඝාතනය කරන, පළිගන්න, දේපළ විනාශ කරන සමාජ විරෝධි සංස්කෘතියක් බිහි වීම නොවැළැක් විය හැකි වේ.

රටක ජීවත්වන ජනසමාජයට අවශ්‍ය සදාචාර සංවර්ධනයට මඟ පෙන්වීමේ කාර්යය අධ්‍යාපනයේ ප්‍රබල වගකීමකි. අධ්‍යාපනය ඔස්සේ ප්‍රගුණ කරන සදාචාර ගති ලක්ෂණ සංස්කෘතිය මූර්තිමත් කරන බව පෙන්වා දිය හැකි ය. පාසල් විෂයමාලාව ඔස්සේ සදාචාර ගුණාංග ළමුන්ට සම්ප්‍රේෂණය කරන අතර, යම් හෙයකින් සදාචාර වටිනාකමක් චර්යාවක් නොමැති අධ්‍යාපනයකින් සදාචාර විරෝධී

සංස්කෘතියක් නිර්මාණය වීමට ඉඩ ඇත. කෙසේ වෙතත් අධ්‍යාපනයෙන් හැඩ ගැසෙන සදාචාර චර්යාව සංස්කෘතියක ජීව ගුණ ලෙස හඳුන්වා දිය හැකි ය. එම නිසා සදාචාරය යනු කුමක්ද අධ්‍යාපනයෙන් සදාචාරය සංස්කෘතික සංවර්ධනය ලබා දෙන්නේ කෙසේදැයි විමසා බැලිය යුතු ය.

සදාචාරය (Morality) යන සංකල්පය පිළිබඳ අදහස් දක්වන මලලසේකර ශබ්දකෝෂය (2003: 591, 592) පෙන්වා දෙන්නේ යහපත, හොඳ විශ්ෂ්ට බව, පිළිගත් බව, විනය ගරුක බව පිළිබිඹු කෙරෙන චර්යා විශේෂයකි. එමෙන්ම මේ පිළිබඳ අදහස් දක්වන පියාජෙට් (Piaget, 1957) පෙන්වා දෙන්නේ සදාචාරය වනාහී චර්යා රීති පද්ධතියකි. එනම් සමාජය එම සංස්කෘතිය පිළිගන්නා හැසිරීම් රටාව සදාචාරයයි. මේ අතර ඔක්ස්ෆර්ඩ් ශබ්දකෝෂය පෙන්වා දෙන්නේ නිවැරදි බව, යහපත් බව සදාචාරය යනුවෙන් අදහස් කළ හැකි බව ය. සදාචාරය පිළිබඳ අදහස් දක්වන අග්‍රවල් (Aggrawal 2003: 10) පෙන්වා දෙන්නේ (Habits: both mind and body) පුද්ගලයෙකුගේ ශාරීරික හා මානසික පුරුදු යහපත් ආකාරයෙන් පවත්වා ගෙන යාමයි. මෙහි දී යහපත් ආචාර සම්පන්නභාවය (good manners) සදාචාර චර්යාවේ වැදගත් අංගයක් බව පැහැදිලි වේ. මෙම විග්‍රහයේ දී සදාචාර සම්පන්නභාවය සඳහා විශේෂ වචන කිහිපයක් භාවිත කර තිබේ. එනම් සාධාරණ අවංක, ඍජු සත්‍යවාදී, සාධුත්වය, නිවැරදි බව, විශ්වාසවන්ත බව, ධාර්මික බව, යුක්ති ගරුක බව, ආත්ම සංයමය, ආත්ම දමනය, ස්වයං හික්මීම යුතුකම් පිළිබඳ අවධියෙන් යුතුවීම (duty consciousness) හා කාරුණික බව (Compassion) යනාදිය යි. මේ අතර ප්ලේටෝ පෙන්වා දෙන්නේ මිනිසා කරන සෑම ක්‍රියාවක් ම අවසන් විය යුත්තේ යහපත යන උත්තරීතර තත්වයෙන් බව ය. තවද සිංහල විශ්වකෝෂය (1965: 423) සදාචාරය මෙසේ විග්‍රහ කරයි.

"සදාචාරයට අයත් ප්‍රධාන කාර්යය වූ කලී මිනිසාගේ යහපත සොයා ගැනීමයි. යහපත යනුවෙන් මෙහිලා ගැනෙන්නේ අන් කිසියම් යහපතක් ලබා ගන්නා මාර්ගය වශයෙන් ම යහපත් නොව අභ්‍යන්තරික යහපතයි. මෙවැන්නක් නැති තැන ආවාට ගියාට මෙන් ගත කෙරෙන මිනිස් ජීවිත අරමුණක් කරා යොමුවන්නේ ඒ පරම සත්‍ය වටහා ගත් විට ය. හොඳ නරක වශයෙන් ක්‍රියාවන් විනිශ්චය කළ හැක්කේ ද මේ පරම යහපත අනුව පමණ යි."

මේ අනුව යහපත සාධනයට හා අයහපත දුරලීමට මඟපෙන්වන චර්යා ප්‍රමිතිමාලාවක් ලෙස සදාචාරය ලෙස හඳුනාගත හැක. සමස්ත ලෝක ප්‍රජාව ම අපේක්ෂා කරන්නේ සදාචාරය පදනම් වූ සංස්කෘතියක් ගොඩනඟා ගැනීම ය. මේ සඳහා පළමුව අධ්‍යාපන විසින් කරනු ලබන මඟ පෙන්වීම වැදගත් වේ.

රටක ගුණාත්මක සංස්කෘතියක් (guality culture) ගොඩනැඟීම ඉහත කී සදාචාර මූලධර්ම පදනම් කර ගෙන සිදුවන්නකි. ළමයින්ගේ ශාරීරික, මානසික, සමාජයීය හා සදාචාර වර්ධනයට අවශ්‍ය සාරධර්ම ඉගෙනුම් අත්දැකීම් ලබාදීම මගින් ඔවුන් යහපත් පූර්ණ පුද්ගලයන් බවට පත් කිරීමට අධ්‍යාපන ක්‍රියාවලිය සමත් වේ. එවිට මනුෂ්‍යයන්ට සුරක්ෂිතව සාමයෙන් හා සතුටින් ජීවත් වීමට යෝග්‍ය සමාජයක් නිර්මාණය කර ගැනීමට අධ්‍යාපනය ප්‍රබල මගපෙන්වීමක් සිදු කරයි. එමෙන්ම අධ්‍යාපනයෙන් විනය ගරුක සමාජයක් ගොඩනැඟීම සිදු කරයි. සාමාන්‍යයෙන් හොඳම විනය පෙන්නුම් කෙරෙන්නේ කෙනෙකු තුළ වැඩෙන ස්වයං පාලනය හේතු කොට ගෙන ය. බොහෝ දුරට දෙමව්පියන් ඇතුලු පිරිස් සාරධර්ම අධ්‍යාපනය ඉල්ලා සිටින්නේ තම දරුවන් විනය ගරුකව ජීවත්වනවා දැකීමට ය. එවැනි විනය ගරුක සමාජයක් උසස් සංස්කෘතියක් යැයි සැලකිය හැකි ය.

කිසියම් සමාජයක් තුළ ජීවත් වන පුද්ගලයින්ගේ ජීවිතය සාරවත් කරන, පොහොසත් කරන, අර්ථවත් කරන, ඵලදායී තත්වයට පත් කරන චර්යා රටා සමුදාය ම උසස් සංස්කෘතියක් නිරූපණය කරන බව මැතිව් ආර්නෝල්ඩ් පෙන්වා දෙයි. ඒ අනුව සමාජ ක්‍රමයක පවතින දයාව ධෛර්යය සත්‍ය වචන ප්‍රකාශ කිරීම, නිරහංකාර මානසිකත්වය හා ගතිපැවතුම්, සාමකාමී ජීවන රටාව, ප්‍රඥාවෙන් කටයුතු කිරීම, මානසික අසහනයෙන් තොරව සතුටින් ජීවත් වීම, මෛත්‍රී සහගතභාවය, විචාරශීලී චින්තනය යනාදිය සාරධර්මීය ලක්ෂණ අතර වැදගත් වේ. එමෙන්ම එකිනෙකා අතර පවතින මිත්‍රශීලී ගති පැවතුම්, මනා සිහිනුවණින් යුතුව කටයුතු කිරීම, ස්වයං පාලනය හෙවත් ස්වයං ශික්ෂණය ඇති කර ගැනීම, අවිහිංසා සහගතව කටයුතු කිරීම, පිළිවෙළකට වැඩ කිරීම, සාධාරණව හා යුක්ති සහගත ලෙස කටයුතු කිරීම, සමානාත්මතාවයෙන් ක්‍රියා කිරීම, ප්‍රියවචන කථා කිරීම, යනාදී කරුණු ද සදාචාර චර්යාවක මූලික ලක්ෂණයෝ වෙති. මේවා

ඕනෑම සමාජයක පැවතිය යුතු සමාජ හර හෙවත් සංස්කෘතික හර පද්ධතීන් ලෙස පොදුවේ අගය කරනු ලැබේ. කිසියම් සංස්කෘතියක් මූර්තිමත් කිරීමට, උසස් තත්වයට පත් කිරීමට අධ්‍යාපනයෙන් සංවර්ධනය කරන මෙම සදාචාර චර්යා බෙහෙවින්ම වැදගත් වේ. පාසලේ සිදුවන අධ්‍යාපන ක්‍රියාවලියේ ප්‍රමුඛතම පරමාර්ථය ද මෙම උසස් සංස්කෘතියක් ගොඩනැඟීමට අවශ්‍ය දැනුම කුසලතා හා ආකල්ප සංවර්ධය කිරීමයි. තමන්ටත් අනුන්ටත් යහපතක් සිදුවන හොඳ හා නරක පිළිබඳ අවබෝධයක් ලබාදීම පාසලේ දී සිදු කරයි. ඒ අනුව ද පැහැදිලි වන්නේ අධ්‍යාපනය උසස් සංස්කෘතියක් නිර්මාණය කිරීමට අවශ්‍ය සදාචාර චර්යාව ප්‍රගුණ කිරීමෙහි නිරතව සිටින බවයි.

මේ අතර පාසල් පද්ධතිය තුළ සදාචාරය වැඩි දියුණු කිරීම සඳහා විවිධ අවස්ථා ඔස්සේ ක්‍රියාමාර්ග ගනු ලැබේ. ඒවා විෂය හා විෂය පරිබාහිර විය හැක. විශේෂයෙන් ම පාසල් කළමනාකරණ ක්‍රියාලිය පදනම් කරගෙන පාසලේ අභ්‍යන්තර හා භෞතික පරිසරය, පංතිකාමර ක්‍රියාවලිය, ගුරු චර්යාව, සමිති සමාගම්, සන්නිවේදන ක්‍රියාවලිය, විෂයමාලාව, විෂය සමගාමී කටයුතු, පාසලේ උදය රැස්වීම, විවේක කාලය, උත්සව සංවිධානය, ක්‍රීඩා කටයුතු ඔස්සේ සංස්කෘතික සංවර්ධනයට දායකවන හර පද්ධතීන් සංවර්ධනය කරනු ලැබේ. මේ පිළිබඳව අදහස් දක්වන විශ්ලේශීය අධ්‍යාපන දාර්ශනිකයෙක් වන ආර්. එස්. පීටර් (Perters, 1969: 27) පෙන්වා දෙන්නේ අධ්‍යාපනයෙන් සංස්කෘතික සංවර්ධනයට අදාළ හරවත් දේවල් ඉගැන්වීමේ කාර්යය ඉටු විය යුතු බව ය.

සංස්කෘතික ප්‍රවර්ධනයට අධ්‍යාපනය සාර්ධර්ම වැඩි දියුණු කිරීම ඔස්සේ දායක වීමේ වැදගත්කම වල්පොල රාහුල හිමියන් (1962: 342) තම අදහස් මෙසේ අවධාරණය කර තිබේ.

"අධ්‍යාපනයෙහි ප්‍රමුඛ පරමාර්ථය විය යුත්තේ සදාචරය හා අධ්‍යාත්ම වර්ධනයයි. මේ අර්ථයෙන් තොර හුදු ශාස්ත්‍රෝද්ග්‍රහණය වැදගත්කමකට නැති දෙයක් හැටියට සැලකුණේ ය. යම් කිසිවකු ධර්මය හදාළේ සදාචාරය හා අධ්‍යාත්මික චරිත වර්ධනය පිණිස නොව ලෞකික ලාභ සත්කාර ලබන අදහසින් නම් ඉගෙනීම පිණිස තම කාලය නාස්ති කරනු වෙනුවට නිදා ගැනීම හොඳයයි සලකන ලද්දේ ය."

මෙම ප්‍රකාශනයෙන් පැහැදිලි වන්නේ සදාචාර වර්ධනයෙන් තොර අධ්‍යාපනය කාලය නාස්ති කිරීමක් බවය. එම නිසා පාසලේ ඍජු ඉගැන්වීම් ක්‍රමය තුළින්, නිදර්ශන මඟින් ඉගැන්වීමෙන්, කතන්දර, ජනශ්‍රැති, ආත්ම කතා ආදිය ඉගැන්වීමෙන්, විෂය මාලාවේ විෂයයන් තුළින් ක්‍රියාකාරී ප්‍රවේශයන් මඟින් සැඟවුණු විෂයමාලාවෙන් ළමුන්ට ලබා දෙන සදාචාර හර පද්ධතීන් සමාරයකින් සංස්කෘතිය සංවර්ධනයට අධ්‍යාපනයේ ප්‍රබල දායකත්වය පෙන්නුම් කරයි.

මේ අනුව ඕනෑම රටක සංස්කෘතියක් අධ්‍යාපනයත් අතර අවියෝජනීය සම්බන්ධතාවක් පවතින බව පෙන්වා දිය හැකි ය. එමෙන්ම සමාජයක සංස්කෘතික සංවර්ධනයට අදාළ පදනම අධ්‍යාපනය මඟින් සිදුවන බව පෙන්වා දිය හැකි ය. අධ්‍යාපනය සංවර්ධනය වන විට සංස්කෘතිය සංවර්ධනය වන බවත්, අධ්‍යාපනය දුර්වල වන විට සංස්කෘතිය දුර්වල වන බවත් තීරණය කළ හැකි වේ.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


*අධ්‍යාපනයේ දාර්ශනික පදනම.* (2004). ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය. නාවල නුගේගොඩ.

අමරසේකර, දයා. (1991), *සමාජ විද්‍යාවේ සිද්ධාන්ත හා විධික්‍රම.* දෙවන මුද්‍රණය, වරකාපොල.

ධර්මදාස, කේ. එන්. ඕ. (1972), *භාෂාව හා සමාජය* (වාග් විද්‍යාත්මක ගවේෂණයක්). සීමාසහිත ලේක හවුස් ඉන්වෙස්ට්මන්ට්ස් සමාගම, කොළඹ 2).

පෙරේරා, ටෙනිසන්. (2001). *මානව විද්‍යාව හා සමාජ විද්‍යා ප්‍රවේශය.* ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, 675ල පී.ද.ඇස්. කුලරත්න මාවත. කොළඹ.

රාහුල හිමි, වල්පොල. (1962 : 343). *ලංකාවේ බුදු සමයෙහි ඉතිහාසය.* අනුරාධපුර යුගය, සීමාසහිත ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ.

වීරසිංහ, හෙන්රි. (1977). *අධ්‍යාපන දර්ශන ප්‍රවේශය.* ලේක් හවුස් ඉන්වෙස්ට්මන් සමාගම.

හෙට්ටි ආරච්චි, ඩී.ඊ. (1965). *සිංහල විශ්වකෝෂය,* රජයේ මුද්‍රණාලය, සංස්කෘතික දෙපාර්තමේන්තුව.

Ballentine, J.H. (1977). *The sociology of education*. Prentice – Hall Inc.

Banks Olive. (1968 : 20). *Multiethic educational theory and practice*. Boston: Allyns Bacon.Unesco (1996 : 85) Learning

Banktock ,G.H. (1968). *Culture, industrialization and education*. London

Bolinger, D. (1968). *Aspect of Language*. New York.

Chapman, K. (1986). *The sociology of schools*. Tavistock publications, London, New York.

Child, 1.2. (1943 : 18,19). *Italian and American*. Yall University Press.

Chinoy, E. (1961). Society and Introduction to sociology. Random House, New York.

Chomsky (1986). *Knowledge of Language: Its Nature, Origin and Use*. New York.

Harris, M. (1989). *Language Processing in Children and Adults*. New York.

Havinghurst, R.J. (1962). *society and Education Allyn Bacon Inc*. Boston.

Ingold, T. (1994). *Companion Encyclopedia of Antropology, Humanity Culture and Social life, Routle age*. II New fetter Lane, London.

Krober, A.L. & Kluckhon, c (1963). *Culture: A critical Review of concept and Definitions*. New York.

Mead, G.A. (1934). *Mind self & Society*. Chicago.

Merill, F.E. (1957). *Sociology and culture*. Prentice Hall, Inc.

Parsons, T. (1961). *The school Class as a Social System*. Glencoe, III, Free Press

Peters, R.S. (1969 : 27). *Ethics and Education*. George Allen & Union Ltd, London, 6th impression.

Sapir, E.A. (1949). *Language (Second ed) Selected writing in Language, culture and personality*. ed David F, Mandelbaum. University of California press.

Stenhouse, L. (1967). *Culture and Education. Thomas Nelson and Sons*. Ltd. Little Collions Street Melbourne.

Tylor, E.B. (1924). *Primitive Culture*. Brentano's, New York.